# කටුවන ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය
------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයට අදාලව යන්ත්‍රෝපකරණ කුලී ආදායම් ලෙස රු. 731,075 ක මුදලක් ලැබී තිබූ අතර මෙම ආදායම සමුච්චිත අරමුදලට බැර කළ යුතු වුවත් එසේ නොකර එයින් රු.438,183 ක මුදලක් පමණක් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ආ) රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර 02ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල රු. 100,200 ක කුලී ආදායම් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගතකළ යුතු වුවත් එසේ නොකර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 65,985 ක වියදම් වර්ෂයේ වියදමින් හා ණයහිමියන්ගෙන් අත්හැරී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,772,300 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,146,223 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| i. | වරිපනම් හා බදු | 41 | 302 | 3 |
| ii. | බදුකුලී | 18,740 | 14,224 | 3,082 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,747 | 1,206 | - |
| iv. | වෙනත් ආදායම් | 46,057 | 47,516 | 11,382 |

#### 2.2.2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර වරිපනම් බදු තක්සේරු කර අයකිරීමට ක්‍රියාකර නොතිබුණි.

#### 2.2.3 බදු කුලී

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කාමර කුලී වටිනාකම වූ රු. 1,094,382 ක් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. 2015 ජුනි 30 දින වන විට මෙම හිඟ මුදලින් රු. 436,250 ක් අයකර ගෙන ඇති බව 2015 ජූලි 08 දින සභාපතිවරයා මා වෙත වාර්තා කර තිබුණි.

### 2.2.4 ජල බදු

-----------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ආදායම් රු.5,476,878 ක් වූ අතර ඉකුත් වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ආදායම රු. 5,158,103 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල හිඟ ජල ගාස්තු ප්‍රමාණය රු. 318,775 කින් වැඩි වී ඇති බවත් එම හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. ජල මනු කියවන්නා විසින් පරිභෝජනය කර ඇති ජල ඒකක ගණන නිසි පරිදි බිල් කිරීමට කටයුතු නොකිරීම නිසා සභාවට ලැබිය යුතු රු. 67,690 ක ආදායමක්ද ලැබී නොතිබුණි.එම හිඟ ආදායම් ජල මනු කියවන්නාගෙන් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. 2015 ජුනි 30 දින වන විට රු. 5,476,878 ක් වූ හිඟ මුදලින් රු. 2,233,490 ක් ද රු. 67,690 ක හිඟ මුදලින් රු. 57,525 ක් ද අයකර ඇති බව සභාපතිවරයා 2015 ජූලි 08 දින මා වෙත වාර්තා කර තිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 5,298,574 ක මුදලක් උසාවි දඩ සහ මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) MG 330 දරන මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අළුත්වැඩියාව වෙනුවෙන් රු. 105,000 ක මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුනද අළුත්වැඩියාව සම්බන්ධයෙන් මෝටර් රථ පරීක්ෂකගේ පෙර හා පසු වාර්තා ලබා ගෙන නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට අයනොවී පවතින එකතුව රු. 80,329 ක ආපදා ණය, විශේෂ හා උත්සව අත්තිකාරම් ශේෂයන් 2015 මැයි 27 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කල් ඉකුත් වූ එකතුව රු. 402,588 ක කර්මාන්ත රඳවුම් මුදල්, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාර නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 අවිධිමත් ගනුදෙනු

---------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තිය අනුව සිය බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරිමේදී ප්‍රාදේශීය සභාවට අන්‍යාකාරයෙන් උපචිත වන සියලු මුදල් ප්‍රාදේශීය සභා අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතු වුවත් ඊට පටහැනිව පෞද්ගලික ආයතනයකින් ප්‍රදේශයේ සුභසාධන කටයුතු සඳහා ලබා දී තිබූ රු.100,000 ක මුදල "සේවක සුභ සාධක සංගමය" නම් වූ පෞද්ගලික ගිණුමකට බැර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලයින් පස්දෙනෙකු සඳහා පත්වීම් ලබා දී රු. 585,616 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ නමුත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(i) (i) වගන්තිය ප්‍රකාර පත්කිරීම් සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යංශ ලේකම්වරයාගේ 2014 ජූලි 02 දිනැති අංක MPH/HYW/MNG/Cer/14 -1 දරන ලිපියේ 01 ඡේදය අනුව මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරිමේදී අමු ද්‍රව්‍ය මත එකතු කරනු ලබන 10% ක අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබුණද සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත වෙනුවෙන් එසේ කටයුතු නොකිරීම නිසා එකතුව රු. 175,975 ක මුදලක් වැඩිපුර බිල් කිරීම් සිදුව තිබුණි.

## 4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය